**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට නිෂ්පාදන ණය, සිනමාශාලා ණය සහ කොවිඩ් - 19 සිනමාශාලා ණය ඇතුළු එකතුව රු.71,648,272 ක් වූ ශේෂයෙන් වසර 05 ඉක්මවූ ණය ශේෂය රු.71,024,268 ක් වූ අතර ඉන් රු.64,602,413 ක් වසර 20 ද ඉක්මවා තිබුණි. කර්මාන්තය බිඳ වැටීම හා කළමනාකරණය විසින් ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මත මෙම ණය අයකරගත නොහැකිවී තිබුණු අතර මුළු ණයගැති ශේෂයෙන් සියයට 93 ක් වූ රු.67,177,716 ක් අඩමාණ ණය වශයෙන් වෙන්කර තිබුණි. පූර්ව වර්ෂ විගණන විමසුම් මගින්ද මේ පිළිබඳව පෙන්වා දී ඇතත් සමාලෝචිත වර්ෂය තුලදී පවත්වන ලද පාලක මණ්ඩල රැස්වීමේදී ද මෙම අයකරගත නොහැකි ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ අවධානය යොමු කරනොතිබුණි. | සිනමාශාලා නවීන තාක්ෂණයෙන් ප්‍රක්ෂේපන කටයුතු සිදුකරන බැවින් 35mm සිනමා ප්‍රදර්ශනය කරවීමේ අවස්ථා අවම වී ඇති අතර මෙම චිත්‍රපට 35mm සිනමාපට බැවින් නැවත ප්‍රදර්ශනය කරවා ණය අයකර ගැනීමේ හැකියාව අහිමි වී ඇත. ඉදිරියේදී රූපවාහිනි නාලිකා හා යූ ටියුබ් නාලිකා මඟින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමට ඇත. | හිඟ හිටි පැරණි ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ)2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන්, අරමුදලට ලැබිය යුතු කුලී දායකත්වය රු. 26,393,457 ක්ද, චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ආදායමින් ලැබිය යුතු රු. 3,532,156 ක්ද, ඇතුළු එකතුව රු. 31,523,282 ක් වූ ශේෂයෙන් රු.23,002,208 ක් වසර 05 ඉක්මවා තිබුණද කළමනාකරණය විසින් මෙම මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වැකන්ද වලව්ව හා නිසලගිර චිත්‍රපට සඳහා ආදායම් ඉපයීමක් නොවන බැවින් මෙම හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක් ඇත. ඉදිරියේදී රූපවාහිනී මාධ්‍ය හරහා චිත්‍රපට ප්‍රදර්ශනය කර ආදායම් ඉපයීමට කටයුතු කරමි. | සංස්ථාවෙන් ලැබිය යුතු කුලී මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ)කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් අක්‍රිය වූ සිනමාශාලාවකට ලබාදී තිබුණු ණය මුදලට අදාළ ගිවිසුමේ 09 වන වගන්තිය ප්‍රකාරව ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2024 ජූලි 31 දින වන විට තවදුරටත් රු. 189,426 ක මුදලක් අයවිය යුතුව තිබුණද, 2022 දෙසැම්බර් 22 දිනට අවසන් වී තිබුණු ණය ගිවිසුමේ කාලය දිර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේදී ණය ලබා දෙන ලද සිනමාශාලාවෙන් අයවීමට ඇති ඉතිරි හිඟ වාරික ගෙවීම් කරන ලෙස ලිඛිතව හා වාචිකව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව ණය අයකර ගැනීමටත් අවසන් වී ඇති ණය ගිවිසුමේ කාලය දීර්ඝ කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල විසින් නිෂ්පාදනය කළ ආගන්තුකයා හා ධනසෘණ චිත්‍රපට වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත රු.1,360,404 ක් වූ නිෂ්පාදන වියදමක් ගෙවිය යුතු අතර වසර 05 කට වැඩි කාලයක සිට පැවත එන එම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් ගෙවීම් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 20,890,342 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12, 976,126 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,914,216 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී රු. 7,695,400 කින් හා අනෙකුත් ආදායම් රු.134,992 කින් වැඩිවී ආයතන පරිපාලන වියදම් රු.103,494 කින් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝගයන්හි පාලක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු ආකාරය පිළිබඳව සඳහන් කර නොතිබීමෙන් 2023 වර්ෂය තුළ එක් පාලක මණ්ඩල රැස්වීමක් පමණක් පවත්වා තිබුණු අතර පෙර වර්ෂයන්හි තත්ත්වය ද ඒ ආකාරයෙන්ම විය. ඒ අනුව, චිත්‍රපට කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණ ද පාලක මණ්ඩලය විසින් සිනමා කර්මාන්තයේ උන්නතිය උදෙසා සක්‍රීය දායකත්වයක් ලබාදී නොතිබුණි. | පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරියේදී සංවර්ධන අරමුදලේ ගැසට් පත්‍රය සංශෝධනය කර එළදායි කාර්යයක් කිරීමට බලාපොරොත්තු වේ. | නියෝග සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ඉහත නියෝග ප්‍රකාරව ඉටුකළ යුතු කිසිදු කාර්යයක් අරමුදල විසින් ක්‍රියාවට නංවා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල මුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණු අතර ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.10,759,729 ක බැංකු ශේෂයක් අරමුදල සතු ව තිබුණි. තවද ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මාස 12 ක කාලය තුළ ද රු. මිලියන 05 කට නොඅඩු මාසික සාමාන්‍ය බැංකු ශේෂයක් උපයෝජනය කිරිමකින් තොරව ජංගම ගිණුමෙහි නිශ්කාර්යයව රදවා ගෙන තිබීම හේතුවෙන් අතිරික්ත මුදල් ආයෝජනය කිරීම තුළින් ලබාගත හැකිව තිබූ පොලී ආදායම අරමුදලට අහිමිව තිබූණි. | චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීමෙන් පසු 2024 වර්ෂයේ පාලක මණ්ඩලය අනුමැතිය මත රු.මිලියන 8 ක් ආයෝජනය කර ඇත. | අරමුදල පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් මුදල් උපයෝජනය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදලේ සමාලෝචිත වර්ෂයේ තැන්පත් පොලී ආදායම රු. 20,507,972 ක් වන විට අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ චිත්‍රපට කර්මාන්තය තුළින් උපයා ගෙන තිබුණු ආදායම රු.2,281,047 ක් තරම් අවම මට්ටමක පැවතුණි. චිත්‍රපට කර්මාන්තයේ බිඳ වැටීමත්, එම කර්මාන්තය නඟා සිටුවීමට මූලික අවධානය යොමු කරනු වෙනුවට මුදල් ආයෝජනය කිරීම සිදුකර තිබීමත් මෙම තත්ත්වයට හේතුවී තිබුණි. | අමාත්‍යාංශ මාරුවීම් මත පාලක මණ්ඩලය පත්කිරීම් ප්‍රමාදවීම් හේතුවෙන් ඔබ විසින් පෙන්වා දී ඇති කරුණ සඳහා ඵලදායි ක්‍රියාවලියක් සිදු වී නොමැත. | චිත්‍රපට කර්මාන්තය නඟා සිටුවීම සහ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට අවධානය යොමු කල යුතුය. |
| (ආ) 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වන හා 05 වන වගන්තිය යටතේ වන නියෝග අංක(4) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) (එ),(ඒ) සහ (ඔ) අනුව පහත කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>i. දේශීය චිත්‍රපට කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සැපයීමට සහ දේශීය වශයෙන් චිත්‍රපට නිෂ්පාදනය කිරීම සඳහා උරදීම හා ආධාර අනුබල දීම. | අමාත්‍යාංශ මාරුවීම් මත පාලක මණ්ඩලය පත්කිරීම් ප්‍රමාද වීම හේතුවෙන් පාලක මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් ඔබ විසින් පෙන්වා දී ඇති කරුණ සඳහා ඵලදායි ක්‍රියාවලියක් සිදු වී නොමැත. එසේම පාලක මණ්ඩල රැස්වීම් එකක් පමණක් 2023.09.04 දින පවත්වා ඇත. ඉදිරියේදී පෙන්වා දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරමි. | කළමනාකරණය විසින් පනතේ නියෝග ප්‍රකාරව අරමුදලේ කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ii. නරඹන්නන්ගේ සහ සිනමා ශාලාවල සේවකයන්ගේ පහසුව හා ප්‍රවේශය සඳහා අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් සිනමාශාලාව විසින් සපයන බවට සහතික කිරීම. | -එම- | -එම- |
| iii. සිනමා කර්මාන්තයෙහි අනෙකුත් අංශයන්හි වැඩි දියුණුව ඇති කිරීම. | -එම- | -එම- |
| iv. සිනමාශාලාවල සැප පහසු ආසන සැපයීම සහ නරඹන්නන්ගේ අවශ්‍යතාවයට සරිලන පහසුකම් වැඩි දියුණු කිරීම. | -එම- | -එම- |
| v. චිත්‍රපටවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා, චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීම. | -එම- | -එම- |
| vi. පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩ සටහන් ඇති කිරීම. | -එම- | -එම- |
| vii.උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා හෝ පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මඟින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම. | -එම- | -එම- |
| viii.වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක එම කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් නිකුත් කිරීම. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| ix. සිනමාශාලා අලුත්වැඩියා කිරීම සහ නවීකරණය කිරීම සඳහාද, අලුත් උපකරණ සවිකිරීම සඳහාද ණය මුදල් සැපයීම. | -එම- | -එම- |
| x. නිෂ්පාදන අංශයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍ර සලකා බැලීම. | -එම- | -එම- |
| xi. උසස් ගණයේ චිත්‍රපට සඳහා මූල්‍යමය ත්‍යාග ප්‍රදානය කිරීම. | -එම- | -එම- |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 877(1) (ඇ) සහ (ඈ) ප්‍රකාරව අරමුදල විසින් 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර අයවැය ලේඛනයක් අනුමත කර ගැනීමකින් තොරව අරමුදලේ වියදම් දරා තිබුණි. | අයවැය ලේඛනයක් සකස් කර නැත. 2023 වර්ෂයේදී සංවර්ධන අරමුදලින් කිසිදු ගෙවීමක් සිදුකර නොමැත. | අරමුදලේ අරමුණු වලට අනුකූලව අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර අනුමත අයවැයකින් තොරව වියදම් නොදැරිය යුතුය. |